"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**
**பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**
**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

"ශ්‍රාවස්ති මන්දිරය", 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"சிராவஸ்தி" கட்டடம் ,32, ஸ்ரீமத் மார்க்கஸ் பெர்னாண்டோ மாவத்தை, கொழும்பு 07.
"Sravasthi Mandiraya", 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

Chief Secretary } Telephone - 2698409 / Fax - 2694667 / Email chiefsecretary@wpc.gov.lk

General Telephone } 2682868 2682869 2682870

My No. } CSO/ENG/1/8/32 Your No. } Date. } 2016.07.21

ගොඩනැගිලි අධ්‍යක්ෂ/ වාරිමාර්ග අධ්‍යක්ෂ/ අධ්‍යක්ෂ (ඉංජිනේරු),
සාමාන්‍යාධිකාරි,පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය(බ.ප.),
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂ (කොළඹ,ගම්පහ,කළුතර)
පළාත් පාලන කොමසාරිස් සහ සියලුම පළාත් පාලන ආයතන ලේකම්වරුන්,
බස්නාහිර පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්,

**<u>ගොඩනැගිලි ගාස්තු උපලේඛණය-2016/2017</u>**

2016.07.21දින සිට නැවත දැනුම් දෙන තුරු ගොඩනැගිලි ඉදිකිරීම්,වැඩි දියුණු කිරීම් සහ නඩත්තු කටයුතු සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කර ගැනීමට උපයෝගී කරගත යුතු ගොඩනැගිලි ගාස්තු උපලේඛනයේ පිටපතක් මේ සමඟ එවමි. ඒ අනුව ප්‍රමාණ බිල්පත් පිළියෙළ කිරීමේදී, වැඩ විෂයන්හි විස්තර හැකිතාක් දුරට ගොඩනැගිලි ගාස්තු ලේඛණයේ සඳහන් පරිදි විය යුතු බව අවධාරණය කරමි.

02. මෙම ලේඛණයේ ඇතුළත් රේට් මිල ගණන් පිළියෙල කිරීමේදී එකතු කළ අගය මත බදු (VAT ), රේට් මිල ගණන් වලට අඩංගු කර නැත.එබැවින් "මුළු පිරිවැය ඇස්තමේන්තු මුදල" ගණනය කිරීමේදී එකතු කල අගය මත බදු මුදලද ,ප්‍රමාණ බිල්පතේ මුළු එකතුවට (එනම් ඍජු ඉදිකිරීම් පිරිවැයට) අමතර මුදලක් වශයෙන් ප්‍රමාණ බිල්පතේ සාරාංශයට ඇතුළත් කළ යුතුය.

03. මෙම ගොඩනැගිලි ගාස්තු ලේඛනයේ සඳහන් මිල ගණන් සකසා ඇත්තේ බස්නාහිර පළාතේ දිස්ත්‍රික් තුනම ආවරණය වන පරිදිය. කෙසේ වුවද,මෙහි සඳහන් ද්‍රව්‍ය වල මිල හා ඔබගේ බල ප්‍රදේශය තුල පවතින මිල ගණන් අතර සැලකිය යුතු වෙනස්කම් තිබේනම් ,ඒ පිලිබඳව මා වෙත දැන්වීමට පියවර ගන්න.එවැනි විශේෂ අවස්ථාවකදී යම් බල ප්‍රදේශයකට පමණක් සීමාවන පරිදි මිල ගණන් සංශෝධනය කිරීමට පියවර ගත හැක.

04. මෙම රේට් මිල ගණන් පිළියෙල කර ගැනීමට උපයෝගී කරගෙන ඇති ගොඩනැගිලි ද්‍රව්‍ය සහ භාණ්ඩවල ප්‍රමිතිය(Specification),ගුණාත්මක බව (material quality) සහ ඉදිකිරීම් නිමාව (Workmanship) ශ්‍රී ලංකා ප්‍රමිති (SLS) ,බ්‍රිතාන්‍ය ප්‍රමිති (BS - EN) සහ (A.S.T.M) ප්‍රමිතීන්ට අනුකූලව සහ ICTAD පිරිවිතර SCA/3/1, SCA/3/2, SCA/3/3, SCA/4(VOL – I), SCA/4(VOL - II), SCA/5, SCA/8 යන ප්‍රකාශනවල සඳහන් අවශ්‍යතාවයන් සහ ගුණාංගයන් සපුරාලන බව උපකල්පනය කරමිනි. ඒ අනුව මෙම මිල ගණන් උපයෝගී කර ගෙන මුළු පිරිවැය ඇස්තමේන්තු සැකසීමේ දී සහ ගෙවීම් කිරීමේ දී ඉහත ප්‍රකාශනවල අඩංගු ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකිරීම් සිදුවිය යුතු බව අවධාරණය කරනු කැමැත්තෙමි.

05. මෙම රේට් මිල ගණන් පදනම් කරගෙන පිළියෙල කරන ලද මුළු පිරිවැය ඇස්තමේන්තුව , උද්ධමනය හෝ වෙනත් හේතූන් නිසා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ වගන්ති අංක 4.3.3 ප්‍රකාරව යාවත්කාලීන කර ගැනීමට අවශ්‍ය අවස්ථාවන්හිදී මිල විචලන සඳහා ICTAD සූත්‍ර A හෝ B පදනම් කරගෙන රේට් මිල පිළියෙල කළ දින සහ ඇස්තමේන්තු කරන දින අතර කාලවකවානුව තුළ සිදුව ඇති මිල විචලනය ගණනය කර ගැනීම සුදුසුය.

06. ගොඩනැගිලි ශාස්ත්‍ර ලේඛණය පරිශීලනය කිරීමේදී සෑම නිලධාරියෙකු විසින්ම දැන සිටිය යුතු කරුණු සංක්ෂිප්තව "ඇමුණුම් අංක 01"හි ඇතුළත් කර ඇත. තවද, මෙම ගොඩනැගිලි ශාස්ත්‍ර ලේඛනයේ වැඩ විස්තර සහ රේට් මිල ගණන් පදනම් කර ගෙන සකස් කර ගන්නා ප්‍රසම්පාදන ලියකියවිලි කට්ටලයට ඇතුළත් විය යුතු අනෙකුත් ලිපි ලේඛන ද ඇමුණුම් අංක 01 - 2016.07.21 හි සඳහන් වේ.

07. මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී භාවිතා කිරීම සඳහා මෙම ලේඛනයේ පිටපත් සියළුම තාක්ෂණ නිලධාරීන් වෙත කරුණාකර නිකුත් කරන්න.

08. මෙම ලිපිය සහ ගොඩනැගිලි ශාස්ත්‍ර උපලේඛණය www.gov.lk වෙබ් අඩවියේ පළාත් ඉංජිනේරු කාර්යාංශයේ වෙබ් පිටුවේ ඇතුළත් කර ඇත.

ඩබ්.එම්.ඩී.එන්.රණසිංහ,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු),
බස්නාහිර පළාත.

ඩබ්. එම්. ඩී. එන්. රණසිංහ
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)
ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)
ශ්‍රාවස්ති මන්දිරය
32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.

පිටපත්:

1. ප්‍රධාන ලේකම් (බ.ප.) : කරු.දැ.ගැ.ස.
2. බස්නාහිර පළාතේ සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් : කරු.දැ.ගැ.ස.
3. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) : කරු.දැ.ගැ.ස.
4. විගණන අධිකාරි : කරු.දැ.ගැ.ස.